01

# ජන සෙත පෙරමුණ

දේශපාලනයට බුද්ධිමත් ප්‍රවිෂ්ඨයක්

මැතිවරණ කොමිෂන් සභාව
23 MAR 2026
නීති අංශය
රාජගිරිය

බත්තරමුල්ලේ සීලරතන හිමි
මහ ලේකම් / J.P
ජනසෙත පෙරමුණ
බත්තරමුල්ල
0112 882028

පක්ෂ කාර්යාලය
නො.185/5බී, දේවාල පාර,
තලංගම දකුණ,
කොස්වත්ත,
බත්තරමුල්ල.

දුරකතන අංක /ෆැක්ස් : **+94 11 2889998/ 0112882028**

**Email: janasethajsp@gmail.com**

janasethaperamuna@yahoo.com

# ජන සෙත පෙරමුණ

දේශපාලනයට බුද්ධිමත් ප්‍රවිෂ්ටයක්

බත්තරමුල්ලේ සීලරතන හිමි
මහ ලේකම් / J.P
ජනසෙත පෙරමුණ
බත්තරමුල්ල
0112 882028

පක්ෂ මූලස්ථානය,
185/බී, දෙවාල පාර,
තලංගම උතුර,
කොස්වත්ත,
බත්තරමුල්ල.
දුරකථන / ෆැක්ස් : 011 2889988
විද්‍යුත් තැපෑල : revbattaramulle@yahu.com

# පූර්විකාව

ශ්‍රී ලංකා මාතාව මහලු වෙමින් සිටින්නීය. ඇය කුඩා කාලයේද හද යෞවනයේ අනන්ත අප්‍රමාණ දුක්ගැහැට විඳ බාහිර අභ්‍යන්තර පුද්ගලයන්ගේත් හා බලවේගවලත් නානාවිධ ආක්‍රමණයන්ට ගොදුරුව දුර්වලව හා අපෙක්ෂා භංගත්වයට පත්ව ඇත.

අපි අපේ මුතුන්මිත්තන්ගේ  කාලයේ දී කීවේ ශ්‍රී ලංකාව දියුණුවෙමින් තිබෙන රටක් ලෙසයි. පසුව අපි අපේ මව්පියවරුන්ගෙන්ද අසා දැනගත්තේ ශ්‍රී ලංකාව දියුණුවෙමින් පවතින රටක් බවයි. දැනුදු අපේ දරුවන්ට කියා දෙන්නේද ශ්‍රී ලංකාව දියුණුවෙමින් තිබෙන රටක් බවයි. අපේ ශ්‍රී ලංකාව, අපේ මාතෘ භූමිය දියුණු රටක් යැයි කියන්නට ලැබෙන්නේ කවදාද..... මෙය ජාතියක් ලෙස අප ඉදිරියේ තිබෙන බරපතලම ප්‍රශ්ණයයි.

වඩාත් යහපත් වූ හෙටක් නිර්මාණය කරන්නට නම් දේශපාලනයට චාර්යාත්මක වූත් බුද්ධිමත් වූත් භාවිතයක් අනුගත කරන්නට සිදුව තිබේ.

ශ්‍රී ලංකාව පළමු කොට දකුණු ආසියාවේ සමගි සම්පන්න වූ ජාතියක් සිටින සශ්‍රීක රටක් බවට පත් කිරීමේ ශක්තිමත් කාර්යය ඉටුකරගත හැක්කේ,

1. පැහැදිළි ජාතික අනන්‍යතාවයක්

2. නිවැරදි. කාටත් එකඟවිය හැකි භාෂා ප්‍රතිපත්තියක්

3. සමාන ලෙස සම්පත් බෙදීයන සමාජ ආර්ථික ව්‍යුහයක් හා මානව හිමිකම් ගරු කරන නීතිමය  රාමුවක් ගොඩ නැගීම පමණි.

මේ සියලු අවශ්‍යතාවයන් පෙරදැරි කරගෙන පරමාණුව මෙන් බෙදී බෙදී යන දේශපාලන අබල දුබලතාවය වෙනුවට පැහැදිළිව ජනතාවට වගකිව හැකි දුර්දර්ශී ශක්තිමත් දේශපාලන ප්‍රවාහයක ආරම්භය වෙනුවෙන් අපි "ජනසෙත පෙරමුණ" බිහි කරමු. මෙය හුදෙක් තවත් දේශපාලන පක්ෂයක් නොවේ. දේශපාලන අත්හදා බැලීමක්ද නොවේ. එහෙත් සැබෑ ජනතා සිත් සතන් හදුනාගෙන තබනු ලබන යෝධ පියවරක් වනු ඇත.

## යොමුව: ජනසෙත පෙරමුණ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව තුල නව පක්ෂයක් ලෙස ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වන "ජනසෙත පෙරමුණ" නිර්මාතෘ ලෙසත්, ආරම්භක මහලේකම්වරයා ලෙසත් පෙනී සිටින පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි වන මාගේ දේශපාලන කටයුතු පිළිබඳ පළපුරුද්ද කෙටියෙන් පහත සඳහන් කරමි.

01) ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලන ව්‍යාපාරය තුල ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස කටයුතු කිරීම


02) ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීම

03) සිහල උරුමය පක්ෂයේ කොළඹ දිස්ත්‍රික් සංවිධායකයකු ලෙස පත්වූ මා එම පක්ෂයෙන් ඉවත්වන තුරු එම ධූරයේ කටයුතු කිරීමට වීම.

04) ජාතික සංවර්ධන පෙරමුණේ සභාපති ධූරය දරමින් දේශපාලන කටයුතුවල නියුක්ත විය.

05) එම පෙරමුණේ කඩුවෙල සංවිධායක ලෙස ප්‍රාදේශීය සභා මැතිවරණයට නායකත්වය දෙමින් කටයුතු කිරීම.

දැනට මා දේශපාලන කටයුතුවලට අමතරව අසරණ සරණ ව්‍යාපෘති මගින් පුලුල් සමාජ මෙහෙවරක නියුක්ත වෙමින් පොදු ජනතාවගේ එදිනෙදා ගැටලු විසඳීමේ උත්සහයක නිරත වී සිටිමි.



# පක්ෂයේ මූලික අන්තර්ගතය

## හැඳින්වීම

අ. මෙම පක්ෂය "ජනසෙත පෙරමුණ " ලෙස හැඳින්වේ

ආ. මෙය ප්‍රජාතාන්ත්‍රවාදී හා සමාජවාදි පක්ෂයකි

ඇ. මෙය පක්ෂ ඉදිරි සියලුම මැතිවරණ සඳහා තරග වදිනු ලැබේ

ඈ. පක්ෂ මූලස්ථානයේ ලිපිනය :

අංක 185/ 5 /බී, දේවාල පාර
තලංගම දකුණ, රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

ඉ. දුරකතන/ෆැක්ස් :0112889998/0112882028

ඊ. විද්‍යුත් තැපෑල : janasethaperamuna@yahoo.com/janasethajsp@gmail.com

උ. පක්ෂයේ නිල ලකුණ : නෙලුම්මල

ඌ. තරග වදින ලකුණ අශ්වයා

**පක්ෂ ව්‍යුහය ක්‍රියාත්මක වීම**

මෙම ව්‍යවස්ථාවේ අවශ්‍ය තැන්වල පක්ෂය යනුවෙන් හැඳින්වෙන්නේ "ජනසෙත පෙරමුණ" යි.

<u>පක්ෂ නායක හා මහලේකම්</u>

අ) නිරන්තරයෙන්ම එහි පක්ෂ නායක එහි මහලේකම් වරයාද වන්නේය.

ආ) වත්මන් පක්ෂ නායක හා මහලේකම් පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි වන අතර මහලේකම්ගේ කැමැත්ත මත පමණක් එම තනතුරේ වෙනස්කම් කල හැක.

ඇ) පක්ෂයේ තීරණ ක්‍රියාත්මක කිරීමේ අයිතිය පක්ෂ නායකත්වයට හිමි වන අතර නායකත්වය ගන්නා සෑම තීරණයක්ම පක්ෂයේ සභාපතිට හා මධ්‍යම කාරක සභාවට දැනුවත් කිරීම සඳහා ව්‍යවස්ථානුකූලව බලය හිමිවන අතර එම තීරණ මධ්‍යම කාර සභාව මගින් අනුමත කරවා ගත යුතුය.

ඈ) 1. අවශ්‍ය අවස්ථාවලදී බලතල නියෝජ්‍ය ලේකම්වරයා වෙත පැවරිය හැකිවීම, මහාසභාවක්, කෘත්‍යාධිකාරී මණ්ඩලයක් හෝ මධ්‍යම කාරක සභාවක් කැඳවීමේ නිවේදනයක් නිකුත් කිරීමේ බලය මහලේකම් සතුවේ.

2. පක්ෂ වාර්තා සකස් කිරීම සහ මැතිවරණ වලදී පක්ෂ නියෝජිතයන් පත් කිරීමේ දී හා අපේක්ෂකයන් තේරීමේ දී අනිවාර්ය සහභාගිත්වය.

3. හදිසි ක්‍රියාමාර්ග ගැනීමේදී අවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳව සභාපතිවරයා ඇතුලු මධ්‍යම කාරක සභාව දැනුවත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී කෘත්‍යාධිකාරී මණ්ඩලය කැඳවීමේ බලතල ලේකම්වරයාට හිමිවේ. පුවත්පත් නිවේදන නිකුත් කිරීමේ බලය මහලේකම්වරයා සතුවේ. පක්ෂයේ ව්‍යවස්ථාවට හෝ ප්‍රතිපත්තිවලට අනුව පක්ෂය මෙහෙය වන පුද්ගලයා මහලේකම් වන අතර බාහිර බලවේග සමඟ සම්බන්ධකම් හා සාකච්ඡා පැවැත්වීම මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව සිදුවේ.

පක්ෂයෙන් පත්වන නියෝජිතවරයෙකු කුමන හෝ ආයතනයකට, පාර්ලිමේන්තු, පළාත් සභා හෝ පලාත් පාලන ආයතන නියෝජනය කරන අතරතුරදී ඔහුගේ අභිමතය පරිදි වෙනත් පක්ෂයකට හෝ වෙනත් කණ්ඩායමකට පක්ෂව බැඳීමෙන් හෝ වෙනත් කණ්ඩායමකට පක්ෂව හෝ ඡන්දය ප්‍රකාශ කිරීමෙන් හෝ අනිසි සහයෝගය ලබාදීමෙන් පක්ෂයේ ව්‍යවස්ථාව උල්ලංඝනය කරනු ලබන ඕනෑම අවස්ථාවකදී කිසිම පූර්ව දැනුම් දීමකින් තොරව ඔහු හෝ ඇය පක්ෂයෙන් හා ඔහු නියෝජනය කරන මන්ත්‍රීධුරයෙන් ඉවත් කිරීමේ බලය මහලේකම්වරයා සතුවන අතර, එම ගන්නා ක්‍රියාමාර්ගය තහවරු කිරීම සඳහා පක්ෂයේ මධ්‍යම කාර සභාව දැනුවත් කිරීම කල යුතුය. එසේම එම පුද්ගලයා වෙනුවෙන් අලුත් නියෝජනයක් සඳහා වෙනත් පුද්ගලයෙකු පත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාපතිවරයා වෙත දැනුම් දීමේ නීත්‍යානුකූල බලය මහලේකම්වරයා සතුවන අතර ඒ පිළිබඳව පක්ෂයේ මධ්‍යම කාර සභාව දැනුවත් කල යුතුය. එම තීරණයට පටහැනිව නීති මාර්ගයට පිවිසීමේ අයිතියක් පක්ෂ ව්‍යවස්ථාව තුල නොමැත.

<u>සභාපති</u>

අ) සභාපතිධුරය පක්ෂ නායක විසින් පත්කරන අතර නායකත්වයේ අභිමතය පරිදි එය වෙනස් කල හැකිය.

ආ) සභාපතිධුරයේ නිල කාලය වසරකි. එකී නිලයට නිල කාලය අවසන් වූ විට සුදුස්සකු පත් කිරීම වසරක් අවසානයේ පැවැත්වෙන මහ සභාවකදී සිදු කල යුතුයි.

ඇ) පක්ෂ නායක නොමැති විට නියෝජ්‍ය ලේකම්වරයාගේ එකඟත්වයෙන් මධ්‍යම කාරක සභාව කැඳවීමේ බලය සභාපතිට හිමි වේ.

<u>භාණ්ඩාගාරික</u>

අ) භාණ්ඩාගාරික තනතුර පක්ෂයේ මුදල් කටයුතු මෙහෙයවීම පිළිබඳව වගකියනු ලැබේ. අය-වැය සම්බන්ධ සියලු කටයුතු වලදී අවශ්‍ය ලේඛන සකස් කිරීම හා අවශ්‍ය විට මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කිරීමට බැඳී සිටී. නිලකාලය තීරණය කිරීම මධ්‍යම කාරක සභාව සතුය.

ආ) පක්ෂ නායක හා ලේකම්ට අමතරව මුදල් ගනුදෙනු සඳහා අත්සන් තැබීමේ බලය භාණ්ඩාගාරිකට නිළ වශයෙන් හිමිවේ.

ඇ) පක්ෂයට ලැබෙන පරිත්‍යාගයන් හෝ ගෙවීම් වෙනුවෙන් නිළ ලදුපතක් නිකුත් කිරීම පිළිබඳව වගකීම භාණ්ඩාගාරික සතුය.

<u>නියෝජ්‍ය ලේකම් හා ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සභාපති</u>

අ) නියෝජ්‍ය ලේකම් ධූරය හා ජ්‍යේෂ්ඨ නියෝජ්‍ය සභාපති තනතුර පක්ෂ නායක විසින් සිදු කරනු ලබන පත්වීමකි. මේ සඳහා පක්ෂ පිහිටු වීමේ පුරෝගාමීන් ලෙස කටයුතු කරන්නන් අතරින් සුදුස්සන් පත් කෙරේ. එකී නිලයන් ඉවත් කිරීමට හෝ වෙනත් සුදුස්සකු පත් කිරීමට බලය පක්ෂ නායක ඇතුළු පක්ෂයේ මධ්‍ය කාරක සභාවට ඇත.

ආ) නියෝජ්‍ය ලේකම් පක්ෂයේ සියළු ලිපි ලේඛණ සම්බන්ධ වගකීමට බැඳී සිටී.

ඇ) නියෝජ්‍ය සභාපතිවරුන් සභාපතිතුමාගේ අනුදැනුම ඇතුව අවශ්‍ය අවස්ථාවලදී සභාවේ හෝ පක්ෂයේ වැඩ කටයුතු මෙහෙය වනු ඇත.

<u>ජාතික සංවිධායක හා මාධ්‍ය ලේකම්</u>

ජාතික සංවිධායක හා මාධ්‍ය ලේකම්ධූරය පක්ෂ නායකත්වය විසින් කරනු ලබන පත් කිරීමකි. පක්ෂය වෙනුවෙන් ජාතික මට්ටමේ කැඳවීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා මාධ්‍ය වෙත පක්ෂයේ නිළ දැන්වීම් ප්‍රචාරක කටයුතු වලට බැඳී සිටී. ඔහුගේ නිල කාලය හා බලතල හා කාර්යභාරය පිළිබඳ වරින් වර මධ්‍යම කාරක සභාව මගින් තීරණය කරනු ලැබේ.

<u>මාධ්‍ය උපදේශක</u>

පක්ෂයේ ආරම්භක පුරෝගාමීන් අතරින් සුදුස්සකු මේ සඳහා පළමු වරට පත් කරන අතර මාධ්‍ය කටයුතු මෙහෙය වීම සඳහා අවශ්‍ය උපදෙස් දීම ඔහුගේ කාර්යභාරය වේ.

<u>කෘත්‍යාධිකාරී මණ්ඩලය</u>

පක්ෂයේ මහලේකම් ඇතුළු නිළධාරීන් අටදෙනා ඇතුලත් කමිටුව පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය වන අතර, හදිසි තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීමට එයට හැකිය. එම තීරණ පසුව මධ්‍යම කාරක සභාවට දැනුම් දිය යුතුය. අවශ්‍ය වුවහොත් මෙම තීරණ වලට සංශෝධන ගෙන ඒමට මධ්‍යම කාරක සභාවට බලය ඇත,

<u>මධ්‍යම කාරක සභාව</u>

අ) පක්ෂයේ නිළ මට්ටමේ තීරණ ක්‍රියාත්මක කිරීමමේ බලය මධ්‍යම කාරක සභාවට හිමිවේ.

ආ) මධ්‍යම කාරක සභාව පක්ෂ නායක සහ සභාපති ඇතුළු කෘත්‍යාධිකාරී මණ්ඩලය සමග දිස්ත්‍රික් සංවිධායකවරු විසිහතර දෙනාගෙන් සමන්විත වේ. පක්ෂයේ සියලු තීන්දු තීරණ ගැනීමේ බල අධිකාරිය මධ්‍යම කාරක සභාව ලෙස සලකනු ලබයි. මධ්‍යම කාරක සභාව පක්ෂ නායකත්වයට ගකීමට බැඳී සිටී. මධ්‍යම කාරක සභාවේ රැස්වීම් සඳහා අවම වශයෙන් 16 දෙනෙකුගෙන් සමන්විත සණපූර්ණයක් තිබිය යුතු අතර, එමගින් නිශ්චිත තීරණ වලට එළඹිය හැකිය. සාමාජිකයන්ට විරුද්ධව කෙරෙන විනයානුකූල තීරණ ගැනීමද මෙයට ඇතුළත්ය.

<u>දිස්ත්‍රික් සංවිධායකවරු</u>

අ) පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ සම්මතයෙන් දිස්ත්‍රික් සංවිධායකවරු තෝරා පත්කර ගැනේ. දිස්ත්‍රික් සංවිධායක තනතුරු පත්කර ගැනීම හා වෙනස් කිරීම පක්ෂ සමුළුවේ දී සිදුකෙරේ.

ආ) දිස්ත්‍රික්කය තුල සියලු ආකාරයේ බඳවා ගැනීම් හා මැතිවරණ සඳහා සංවිධායකයින් තෝරා ගැනීම හා ශාඛා සමිති සංවිධාන කටයුතු ඔහුට අයත් නිල කාර්යයන්ය.

<u>ජාතික සංවර්ධන සභාව</u>

අ) ජාතික සංවර්ධන සභාව මධ්‍යම කාරක සභාව හා ආසන සංවිධායකවරුන්ගෙන් සමන්විත වේ.

ආ) ජාතික සංවර්ධන සභාව පක්ෂ නායක/සභාපතිගේ කැඳවීම මත අවශ්‍ය විට රැස්වේ. ජාතික මට්ටමේ යෝජනා සාකච්ඡා කර එකඟතාවයට පත්වීම ජාතික සංවර්ධන සභාවේ කාර්යභාරය වන අතර ජාතික මට්ටමේ සංවර්ධන යෝජනා ජාතික සංවර්ධන සභාවේ අනුමැතියෙන් ක්‍රියාවට නැගිය යුතුය.

ආ) ජාතික සංවර්ධන සභාවට නිල කාලය බලපාන්නේ නැත.

<u>පක්ෂ සාමාජිකත්වය</u>

අ) පක්ෂ සාමාජිකත්වය නියමිත ආකෘති පත්‍රයක් පිරවීමෙන් ලබාගත යුතුය.

ආ) පක්ෂයේ සාමාජිකත්වය නියමිත සාමාජික මුදල් ගෙවා ලබාගත යුතුය. පක්ෂයේ මධ්‍යම කාරක සභාව මගින් සාමාජිකත්වය ලබා ගැනීම සඳහා ගෙවිය යුතු මුදල තීරණය කරනු ලැබේ.

<u>පක්ෂ සාමාජිකත්වය</u>

පක්ෂ සාමාජිකත්වය ලබා නැති කිසිවකුහට පක්ෂයේ නිළතල දැරීම හෝ මැතිවරණ සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් නොමැත.

පක්ෂයේ සියලුම සාමාජිකයන් පක්ෂයේ ප්‍රතිපත්ති රැකීමට බැඳී සිටින අතර, පක්ෂයේ ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම, විනය විරෝධී කාර්යයක් ලෙස සලකනු ලැබේ. සාමාජික මුදල නිසි පරිදි ගෙවීම සාමාජිකයන්ගේ වගකීම වන අතර, නියමිත මුදලට වඩා වැඩි මුදලක් පරිත්‍යාග වශයෙන් පක්ෂයට ලබාදීමේ හැකියාව ඇති අතර, එම සියලුම පරිත්‍යාග හෝ ගෙවීම් වෙනුවෙන් පක්ෂයේ නිළ ලදුපතක් ලබාගත යුතු අතර, පක්ෂයේ භාණ්ඩාගාරිකගේ අත්සනින් එය වලංගුය.

කිසියම් සාමාජිකයෙකුට විරුද්ධව විනයානුකුල ක්‍රියා මාර්ග ගැනීමට පක්ෂයේ මහාලේකම් සභාපති ඇතුළු මධ්‍යම කාරක සභාවට හැකිවන අතර, එම තීරණය අධිකරණය ඇතුළු කිසිදු ආයතනයක ප්‍රශ්න කිරීමකට භාජනය කළ නොහැක. එම තීරණ කිසිවෙකුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙස නොසැලකේ.

පක්ෂ ව්‍යවස්ථාව තුළ රැදෙමින් පක්ෂයේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙනයාම සාමාජිකයින්ගේ වගකීම වන අතර, සිය දේශපාලන අභිලාශයන් පක්ෂයේ අභිලාෂයට වඩා දෙවැනි කොට සැලකීමට බැඳී සිටී.

පක්ෂයට හානි වන අන්දමින් හැසිරීම, වෙනත් බලවේග වලට උදව් කිරීම හෝ ත්‍රස්තවාදී කටයුතු වලට මැදිහත් වීම කල්ලිවාදය සඳහා ක්‍රියාත්මක නොවීමටද, පක්ෂයේ අරමුදල් හා සම්පත් අනිසි ලෙස පරිහරණයෙන් වැළකීමටද සාමාජිකයා බැඳී සිටී.

<u>පක්ෂයේ අනුශාසක මණ්ඩලය</u>

පස් දෙනෙකුගෙන් සමන්විත අනුශාසක මණ්ඩලයක් පත්කර ගතහැකි අතර, එය පැවිදි අනුශාසකවරු තිදෙනෙක්, පූජකවරු එක් අයකු හා ගිහි අනුශාසක එක් අයකුගෙන් සමන්විතය.

## *පක්ෂයේ නිළධාරි මණ්ඩලය*

| | |
|---|---|
| 1. නිර්මාතෘ, පක්ෂ නායක හා මහලේකම් | - පූජ්‍ය බත්තරමුල්ලේ සීලරතන හිමි |
| 2. සභාපති | - පූජ්‍ය ගලගම සෝමානන්ද හිමි |
| 3. නියෝජ්‍ය ලේකම් | - එල්. ඩී. පී. ජයසේකර මහතා |
| 4. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති | - 1. කේ. සංකර් මහතා<br>2. නීතිඥ ඊ. ඒ. ලියනගම මහතා |
| 5. භාණ්ඩාගාරික | - උදය ඉන්ද්‍රජිත් මහතා |
| 6. ජාතික සංවිධායක/ මාධ්‍ය ලේකම් | - එම්. ආර්. හෙට්ටිආරච්චි මහතා |

7. විගණන කමිටු සාමාජිකයින් තිදෙනෙකු මධ්‍ය කාර සභාව තුලින් පත්කර ගැනේ.

| | |
|---|---|
| 8. මාධ්‍ය උපදේශක | - ධර්මසේන වැලිවිටිගොඩ මහතා |

අරම්භක දිනය : 2008. 05. 05

# *පක්ෂයේ මූලික අරමුණු*

**ශ්‍රී ලංකා රාජ්‍යය**

1. i ii iii

*රටේ විධායකය*

(i) ඔහු අනිවාර්යයෙන්ම වයස අවුරුදු 45 ඉක්ම වූ ශ්‍රී ලාංකික බෞද්ධයකු විය යුතුයි.

(ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යවස්ථාවේ අඩංගු ඒකාධිපති ස්වභාවය නැති කිරීම සඳහා යම් යම් අවශ්‍ය කරණ සංශෝධන ගෙන එන අතර එම අණ පනත් පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට අවශ්‍ය කරන සහයෝගය පාර්ලිමේන්තුව නියෝජනය කරන හා නොකරන සියලුම පක්ෂ වලින් ලබා ගැනීමට අවශ්‍ය සර්වපාක්ෂික සමුලුවක් කැඳවනු ලැබේ.

(iii) විධායක ජනපති බලතල ආවරණය වී ඇති නීතිමය හා තත්වයන් අහෝසි කිරීම.

(iv) දැනට ක්‍රියාත්මක ජනාධිපතිවරයා තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය අප පක්ෂය පිළි ගන්නා අතර එකී ධූරයේ නිළ කාලය වසර 6 ක් ලෙසද දෙවතාවක් පමණක් තරඟ වැදිය හැකි බවද පිළිගනී.

(v) බහු ආගමික බහු වාර්ගික රටක් වන ශ්‍රී ලංකාව තුළ ශක්තිමත් විධායකයක් තිබීම අප පක්ෂය පිළිගනී.

## *ව්‍යවස්ථාදායකය*

(I) ජන උරුමය මූලික වශයෙන් වත්මන් පාර්ලිමේන්තු ක්‍රමය පිලිගනී. එහෙත් පාර්ලිමේන්තුවේ මැතිවරණ ආසන මට්ටමින් පවත්වා ආසන බල ප්‍රදේශයකට වග කියන මහජන නියෝජිතයන් තෝරා ගැනීම අනුගමනය කරයි. යම් හෙයකින් රටේ ජන අනුපාතය අනුව සුදුසු නියෝජිතයකු පත් නොවුන හොත් එකී ජනවර්ග පදනම සලකා බලා ප්‍රතිශතයක් වශයෙන් ගෙන ජාතික ලැයිස්තුවට සමාන ක්‍රමයකින් සුදුස්සන් පත් කරනු ඇත.

(ii) පාර්ලිමේන්තුවේ නිල කාලය වසර 06 කි. එක් මහජන නියෝජිත තනතුරක් (මංත්‍රීධූරයක්) සඳහා ඉදිරිපත් විය හැක්කේ දෙවතාවක් පමණි. එහෙත් ජ්‍යෙෂ්ඨ අමාත්‍ය තනතුරක් හෝ වෙනයම් පක්ෂයේ නිලයක් දරන්නේ නම් නාමයෝජනා ලබාදීමට පක්ෂයේ මධ්‍යම කාරක සභාවට හැකියාව ඇත.

(iii) දැනට ක්‍රියාත්මක වන පාර්ලිමේන්තුවේ ඇති නියෝජනය සංඛ්‍යාත්මකව වැඩි නොකරන අතර අවශ්‍ය කරන ජනකොටස් හා ආසන නියෝජනය වන පරිදි ව්‍යුහාත්මක වෙනස්කම් සඳහා මූලිකත්වය දෙනු ලැබේ.

## *අධිකරණය*

(i) ශ්‍රී ලංකා අධිකරණය ස්වාධීන ආයතනයක් ලෙස ජනතා පරමාධිපත්‍ය ආරක්ෂා වන පරිදි හා ජනතාව ආරක්ෂා කරන උත්තරීතර ආයතනයක් ලෙස සලකනු ලැබේ.

(ii) අධිකරණයේ ගෞරවය ආරක්ෂා වන පරිදි දේශපාලන බල අධිකාරිය මැදිහත් වීම අප පක්ෂය අනුමත නොකරයි.

(iii) අග්‍රවිනිශ්චයකාරතුමා අධිකරණයේ උත්තරීතර පුද්ගලයා ලෙස සලකන අතර දණ්ඩනීති සංග්‍රහයේ හා පාර්ලිමේන්තු අණපනත් සම්බන්ධ යම් යම් සංසෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීම කාලීනව සිදු කරනු ඇත.

## *අමාත්‍ය මණ්ඩල ව්‍යුහය*

(i) අග්‍රාමාත්‍යවරයා ඇමති මණ්ඩලයේ ප්‍රධානියා වන අතර ඔහු විසින් අමාත්‍ය මණ්ඩලය මෙහෙයවනු ලබයි.

(ii) පාර්ලිමේන්තුවේ බහුතර ඡන්ද විමසීම මගින් අග්‍රාමාත්‍යවරයා තෝරාපත් කරගනු ලැබේ.

(iii) අගමැති ඇතුලුව මුලු ඇමති මණ්ඩලයම ව්‍යවස්ථාව තුලින් 30 කට සීමා කෙරේ.

(iv) නියෝජ්‍ය ඇමති තනතුරු සංඛ්‍යාවද 30 කට සීමා කෙරන අතර වරප්‍රසාද නෙලබන තරුණ මන්ත්‍රීවරුන් එකී නියෝජ්‍ය අමාත්‍යධූර සම්බන්ධීකාරකයින් ලෙස පත් කෙරේ.

(v) කැබිනට් අමාත්‍යධූරයක් ලබාදීමට වසර 10 ක දේශපාලන පළ පුරුද්ද සලකා බලන අතර ඔහු අනිවාර්යයෙන්ම පිළිගත් පක්ෂ නායකයකු/ආගමික පූජකයකු හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශය/උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගත් වෘත්තිය මට්ටමේ අයකු විය යුතුයි.

## *පළාත් සභා සහ පළාත් පාලනය*

(i) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඉදිරියට යමින් දැනට පවතින පළාත් සභාවල නියෝජනය ආසන මට්ටමින් හා පක්ෂ හෝ කණ්ඩායම් මගින් ඍජුවම තේරීමේ ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සංශෝධන ගෙන එන අතර එමගින් මනාප ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කරන අතර කිසියම් හෝ නියෝජනයක් නොලැබූ තරඟ කණ්ඩායම් හෝ සියලු ජන කොටස් වෙනුවෙන් එක් දිස්ත්‍රික්කයක් ලැබූ මුලු ඡන්ද ප්‍රමාණයෙන් 10% ඉක්මවන අවස්ථාවකදී එම වැඩිවන ප්‍රමාණයට එක් නියෝජිතයකු බැගින් තෝරාපත් කිරීමේ බලය ඡන්ද කොමසාරිස්ට පැවරීමට හා එම නියෝජිත ධුර කාලය උපරිම වශයෙන් වසර 5 කට සීමා කිරීම.

(ii) පළාත් සභා සඳහා මධ්‍යම ආණ්ඩුවේ ඇති බලතල විමධ්‍යගත කිරීමට පියවර ගන්නා අතර පළාත් ආණ්ඩුකාර හා පළාත් මහ ඇමති පාර්ලිමේන්තුවට වග කියන පුද්ගලයන් බවට පත් කිරීම.

(iii) පළාත් සභා මට්ටමේ පවතින දෙපාර්තමේන්තු ප්‍රධානි/සහකාර පොලිස් අධිකාරි බලතල ක්‍රියාත්මක කිරීමේ අයිතිය තහවුරු කෙරන අතර සියලුම බඳවා ගැනීම් මධ්‍යම රජයේ අධීක්ෂණයට යටත්ව අවම සුදුසුකම් හා තරඟ විභාග තුළින් සිදු කිරීම හා එය වසරකට එක් වතාවක් පමණක් ක්‍රියාත්මක කිරීම.

(iv) ජාතික සංවර්ධනයට පමණක් ඉවහල් වන ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මධ්‍යම රජයට භාහිරව හා පාර්ලිමේන්තු අනුමැතියට යටත්ව විදේශ ආධාර ගැනීමේ නිදහස.

(v) යම් අවස්ථාවක දී බලතල ඉක්මවා කටයුතු කරන පළාත් සභාවක් විසුරුවා හැරීමේ බලය පළාත් ආණ්ඩුකාරවරයා සතු වේ.

(vi) දැනට පවතින සියලුම පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් පැරණි හෝ නව කොට්ඨාශ පදනම මත සිදු කරනු ලබන අතර මනාප ක්‍රමය අහෝසි කරනු ඇත.

(vii) දැනට පවතින පළාත් පාලන සීමාවන් සහ පැරණි දේශපාලන ඡන්ද කොට්ඨාශ ක්‍රමය සංසෝධන වලට යටත් කෙරේ.

(viii) පළාත් පාලන ආයතන සඳහා පත්වෙන නගරාධිපතිවරුන් හෝ ප්‍රාදේශිය සභා සභාපතිවරුන්ගේ බලතල වල තිබෙන ඒකාධිපති ස්වරූපය අහෝසි කරන අතර දැනට පළාත් සභාවේ මනාපය දිනා ගන්නා පක්ෂ හෝ කණ්ඩායම් නායකයින් සභාපති තනතුරට පත්විය යුතු යැයි නීති පනවනු ලැබේ.

## ආර්ථික අරමුණු

(i) දේශීය ආර්ථිකයට මූලිකත්වය දෙමින් කෘෂිකර්මය හා දේශීය අමුද්‍රව්‍ය මුල් කොටගත් කර්මාන්ත පද්ධතියක් රට තුල ස්ථාපිත කරවන අතර රාජ්‍ය අංශ හා දේශීය සමාගම් ඒකාබද්ධ කිරීම තුළින් නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත්ව සංසරණය කිරීමක් ඒතුළින් බුද්ධි ගලනය අවම කිරීම, විරැකියාව අවම කිරීම හා රට තුළ නිෂ්පාදන ඉලක්ක කරා මෙහෙය වීම ඉල්ලුමට සැපයුම යන න්‍යාය මත පිහිටමින් ශ්‍රී ලංකාව තුළ හැකි උපරිම අංශ වලින් කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව ස්වයංපෝෂිත තත්වයකට පත් කිරීමේ වැඩ පිළිවෙලක් වහාම ක්‍රියාත්මක කිරීම.

(ii) විවෘත ආර්ථිකයට සීමා පැනවීමෙන් අනවශ්‍ය භාණ්ඩ ආනයනය නවත්වා එහෙත් ආනයනය කරන භාණ්ඩ සඳහා වැඩි බදු පනවනු ලැබේ.

(iii) දේශීය හා මිශ්‍ර ආර්ථිකය සමබරව පවත්වා ගැනීම වෙනුවෙන් ජාතික ආර්ථික ප්‍රතිපත්තියක් පැනවීම.

(iv) මහා පරිමාණ ව්‍යාපෘති සඳහා විදේශීය ණය ලබා ගැනීම හා එම ණය ආයෝජනය විධිමත්ව හා විනිවිධ භාවයකින් යුක්තව පරිහරණය කිරීම පිණිස දේශපාලනඥයින්ගෙන් තොර විද්වත් කමිටුවක් මගින් ජාතික සංවර්ධන සැලසුම් සකස් කිරීම.

(v) වී ගොවිතැන, උක් වගාව, පොල් කර්මාන්තය, වාරි මාර්ග හා ජාතික විදුලි බල පද්ධතිය ඉදිරි වසර 30-50 ත් අතර කාලයකට සරිලන පරිදි ප්‍රමුඛත්ව වැඩ පිළිවෙලකට යටත් කිරීම හා රටට බහු විධි කාර්මීකරණ කලාප පළාත් සහා මට්ටමින් ඇති කිරීම.

(vi) ජාතික වැඩ පිළිවෙලකට යටත් වූ රාජ්‍ය අංශයේ ඵලදායීතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස දේශීය විශ්ව විද්‍යාල පද්ධතියේ ප්‍රමුඛාචාර්යවරුන්ගෙන් සහය ලබා ගැනීම.

(vii) ජාතික අවශ්‍යතාවයට සරිලන පරිදි පරිගණක ඥානය දියුණු කිරීම හා බහු තාක්ෂණික දැනුම ලැබූ තරුණ තරුණියන් අවශ්‍ය කරණ පරිදි සේවයේ යෙදවීම.

(viii) ඉන්ධන භාවියට හා ඉන්ධන නාස්තිය නැති කිරීමට අවශ්‍ය කරන දැඩි නීති සකස් කිරීම සහ පොදු ප්‍රවාහන පද්ධතියට අයත් සියලුම රථ වාහන වලට අනවශ්‍ය ලෙස කාලය නාස්ති කිරීමට නොහැකි වනසේ සීමා පැනවීමෙන් මහජනයාගේ කාර්යක්ෂමතාවය වැඩි කිරීමට පියවර ගන්නා අතර එමගින් රටේ ඵලදායීතාවය වැඩි කිරීමත් අවසන් වශයෙන් විදේශ විනිමය ඉතිරි කර ගැනීම හා පරිසර දූෂණය අවම කිරීමත් මෙහි අරමුණ වේ. ජාතික ඉන්ධන ප්‍රතිපත්තියක් මගින් සියලු ප්‍රවාහන කටයුතු වලට සීමා පනවන අතර එය නීති පද්ධතියකට යටත් කර ධාවන තත්වයට නුසුදුසු මගී ප්‍රවාහන රථ ඉවත් කිරීම.

## *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය*

(i) සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා තුනම සම තැනෙහි ලා සලකන අතර එකී භාෂා තුනම රාජ්‍ය භාෂා ලෙස සලකයි.

(ii) වාර්ගික ගැටලු අවම කිරීම ජාතික සමගිය ගොඩනැගීම සඳහා දැනට ඉමහත් බාධාවක්ව පවතින සන්නිවේදන දුෂ්කරතා මග හැරීම සඳහා සියලු ජාතීන් මෙකී භාෂා තුනම ප්‍රගුණ කළ යුතු බවට නීති පැනවේ.

(iii) අධ්‍යාපන විෂය මාලාවට වෛකල්පිත විෂයයන් ලෙස ප්‍රධාන භාෂාවට අමතරව අනිකුත් භාෂා දෙක අනිවාර්ය කෙරේ.

(iv) රාජ්‍ය සේවයේ කඩඉම් විභාග හා උසස් වීම් සඳහා අවශ්‍ය නිර්නායකයන් වලදී භාෂා කුෂලතාවය මනින විභාග පැවැත්වේ.

(v) රාජ්‍ය සේවයේ හා අධිකරණ ක්ෂේත්‍රයේදී තමන් කැමති භාෂා මාධ්‍යයකින් පෙනී සිටීමට අවශ්‍ය සේවාව ලබා ගැනීමට රටේ පුරවැසියන්ට ඇති අයිතිය තහවුරු කෙරේ.

## *ශ්‍රී ලංකාවේ ජාතිකත්ව ප්‍රතිපත්ති*

(i) ශ්‍රී ලංකාව සියලු පුරවැසියන්ගේ නිජබිම ලෙස සැලකේ.

(ii) ජාතිය යනුවෙන් විමසන අවස්ථාවේදී එය "ශ්‍රී ලාංකික" යනුවෙන් භාවිතා කෙරේ.

(iii) එසේ වුවත් ජාති හා ආගම් වල ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් දැනට ක්‍රියාත්මක ජාතික නිවාඩු දින හා උත්සව ඒ අයුරින්ම පිළිගනී.

(iv) රට තුළ වාර්ගික ගැටුම් බෙදීම් නැති කිරීම පිණිසත් අන්‍යෝන්‍ය වශයෙන් ජාතීන් අතර විශ්වාසය හා සහෝදරත්වය තහවුරු කිරීම පිණිසත් මිශ්‍ර විවහා සඳහා රජයෙන් දිරි ගැන්වීම් ලබාදේ.

## *සමාජ අරමුණු*

(i) සියලු ස්ථරයන් තුළ නෛතික රාමුවකින් ස්ථාපිත කිරීම

(ii) සියලු ආගම්වල ආගමික වටිනාකම හා අනන්‍යතාවය හා ගෞරවය ආරක්ෂා කිරීම.

(iii) සියලු ජාතීන් හා ආගම් අතර සුහඳතාවය ඇති කර ගැනීමේ ප්‍රායෝගික වැඩ පිළිවෙලක් සකස් කිරීම තුළින් ජනවාර්ගික ගැටලු නැති කිරීම හා සමානාත්මතාවය ඇති කිරීම.

(iv) උගතුන් හා බුද්ධිමතුන්ගේ ශ්‍රම දායකත්වය රටේ සංවර්ධන ක්‍රියාවලියට ලබා ගැනීම.

(v) විනය ගරුක සමාජයක් ඇති කිරීම තුළින් වංචනික ක්‍රියා නැති කිරීම සහ අල්ලස හා දූෂණය නැති කිරීම සඳහා දැනට පවතින අපරාධ නීතිය සංශෝධනය කිරීම.

(vi) නාගරික හා ග්‍රාමීය මට්ටමේ ආගමික සිද්ධස්ථාන කේෂත්‍රකොට පිහිටුවන ලබන සංස්කෘතික මධ්‍යස්ථාන මගින් ප්‍රජාව හැසිර වීම.

(vii) නිදහස් අධ්‍යාපනයේ වරමින් විශ්ව විද්‍යාල දක්වා අධ්‍යාපනය ලබාගෙන පසුව රටට අහිමි වෙන බුද්ධිමත් පුරවැසියන් පිළිබඳ දැඩි සැලකිල්ල යොමු වේ. බුද්ධි ගලනය නවතා ඒ වෙනුවට එම මානව සම්පත් රටේ යහපත වෙනුවෙන් යෙදවීමට අධ්‍යාපන ක්‍රමයක් ඒ හා සමානව නිෂ්පාදන ක්‍රියාවලියක් ඊටම සාපේක්ෂව නිපුණතා සංවර්ධනයත් සිදු කෙරේ.

(viii) කාලය කළමණාකරණය කිරීම කෙරෙහි විශිෂ්ඨ අවධානය යොමු වේ.

(ix) භාවිතයට නොගන්නා භෞතික සම්පත් 100% ක්ම භාවිතා කිරීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති මාලාවක් සකස් කෙරේ.

## අධ්‍යාපනය

(i) රටේ අධ්‍යාපන ක්‍රමය ජාත්‍යන්තර තලයට ගැලපෙන අයුරින් සකස් කෙරේ. එහෙත් ඒ තොරතුරු තාක්ෂණය/කාර්මික ඥාණය හා භාෂා කුෂලතාව යන අංශ කෙරෙහි විශේෂ වශයෙනි.

(ii) ශ්‍රී ලාංකික අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ ඉතිහාසය/සාහිත්‍යය/සංස්කෘතිය මත පදනම්ව සකස් කරනු ලබයි. මෙහිදී ශ්‍රී ලංකා රාජ්‍ය දිවයිනක් ලෙස සලකා සම සීත උෂ්ණ කලාපීය රටක් වශයෙන් ගෙන, එසේම කෘෂි ආර්ථිකයක් පසුබිම් වූ රටක් යන මූලික කරුණ මත අධ්‍යාපන ක්‍රමය සකස් කරනු ලබයි.

(iii) මානව සම්පත් සංවර්ධන විෂයක් ලෙස ගෙන ශ්‍රම බලකායට ප්‍රමුඛත්වය හිමි වේ. ඒ අනුව ජනතාව රජයේ සේවාවන්ට ඇති ප්‍රවණතාවය අඩුකර ස්වයං ආර්ථික රටාවකට ජාතිය නැඹුරු කරවීම කෙරෙහි අධ්‍යාපන ප්‍රතිපත්ති සංශෝධනය කෙරේ.

(iv) රටතුල ක්‍රියාත්මක පෞද්ගලික විශ්ව විද්‍යාල මෙන්ම සෙසු අධ්‍යාපන ආයතන රජයේ අධීක්ෂණයට හා ප්‍රමිතිකරණයට යටත් කෙරේ.

(v) රට කලාපීය වශයෙන් ගෙන හැම අධ්‍යාපන කලාපයකටම සමාන යටිතල පහසුකම් ලබා දී කොළඹ උසස් පාසල්වලට ඇති තරඟකාරිත්වය අහෝසි කරනු ලැබේ.

## විදේශ ප්‍රතිපත්ති

(i) ශ්‍රී ලංකාව විසින් දැනට අනුගමනය කරණ විදේශ ප්‍රතිපත්තිය අඛන්ඩව වඩා සුහදශීලි මාවතකට නැඹුරු කරවන අතර වඩාත් ක්‍රමවත්, තානාපති සේවාවක් ස්ථාපිත කෙරේ. අප පක්ෂය දකින අයුරු ශ්‍රී ලාංකික අනන්‍යතාවය හා රටේ සංස්කෘතික මුහුණුවර මෙන්ම රටේ පුරවැසියන්ගේ ආරක්ෂාව මෙකී තානාපති සේවාවන් මගින් තහවුරු විය යුතුය. ඒ සඳහා ක්‍රියාශීලි බුද්ධිමත් පුද්ගලයින් පත්කරන අතර දේශපාලන හිතවත්කම් මත කරනු ලබන පත්වීම් නවතා දමනු ලැබේ.

(ii) ලිහිල් ආර්ථික ප්‍රතිපත්ති හා කොන්දේසි මත අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් විදේශ ආධාර හා සම්පත් ලබාගනු ලැබේ.

(iii) කලාපීය වශයෙන් සෙසු රාජ්‍යයන් සමඟ සුහදතාවය වර්ධනය කරගැනීමත්, ආර්ථික සම්පත් හුවමාරුවත් එකී රාජ්‍යයන් හි සංස්කෘතික සම්බන්ධතා බෙදා ගැනීමත්, කාර්මික දැනුම හා තාක්ෂණය අප රටට වඩාත් ඵලදායි ලෙස ලබාගැනීමටත් අවශ්‍ය පියවර ගනු ලැබේ.